# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2031/48 - 2017 අගෝස්තු මස 11 වැනි සිකුරාදා - 2017.08.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය: DEV/LND/02/ACQUI/04-14.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශ්‍යතාවය ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවයේ විස්තර* :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාඹටුන්න ග්‍රාම නිළධාරි වසමේ, නාඹටුන්න ගමේ පිහිටි මාර/2698 දරන මූලික පිඹුරේ, කැබලි අංක 01 ඉඩම් කොටස (ප්‍රමාණය හෙක්ටයාර් 2.3033 ක් පමණ)

කැබලි අංක 01

ඉඩමේ නම: ගොරකපදුරහේන *නොහොත්* ගොරකගහහේන, බබියලගෙකුරුදුවත්ත සහ වෙලන්කැටිය; විස්තරය: ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක් ඇත; ප්‍රමාණය: හෙක්ටයාර් 2.3033

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 සැප්තැම්බර් මස 14 වැනි දින පෙ. ව. 10.00 ට දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 අගෝස්තු මස 30 වැනි දිනට මත්තෙන් එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශ්‍යතාවයන් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

රංජිත් යාපා,
අත්කර ගැනීමේ නිලධාරි/ප්‍රාදේශීය ලේකම්,
දෙවිනුවර.

2017 ජුලි මස 13 වැනි දින,
දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

08 - 912

1A - G 26058 - 24 - (2017/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.